# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

**මහවැලි සංවර්ධන, කෘෂිකර්ම, වාරි මාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය**

## මහවැලි බල ප්‍රදේශයන්ට අයත් වැව් හා ජලාශ තුල පරිසර හිතකාමී සංචාරක බෝට්ටු / ඔරු සේවා පවත්වා ගෙන යාම සඳහා කැමැත්තක් දක්වන සහ හැකියාවක් ඇති ආයෝජකයින්ගෙන් මිල ගණන් කැඳවීම

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ බල ප්‍රදේශ තුල පිහිටි වැව් හා ජලාශ තුල දෙස් විදෙස් සංචාරකයින් සඳහා පරිසර හිතකාමී සංචාරක බෝට්ටු / ඔරු සේවා පවත්වා ගෙන යාමට බදු අවසර ලබා දීම සඳහා ව්‍යාපෘති වාර්තා සහ මිළ ගණන් කැඳවනු ලැබේ. මේ සඳහා අවශ්‍ය අයදුම්පත්‍රය, කොන්දේසි හා උපදෙස් ප්‍රධාන කාර්යාලයේ 05 වන මහලේ පිහිටි ව්‍යාපාර සංවර්ධන අංශයෙන් රු. 1000.00 ක ආපසු නොගෙවන මුදලක් ගෙවා 2020.03.10 දින ප.ව. 2.00 දක්වා ලබාගත හැක.

ඔබගේ ව්‍යාපෘති වාර්තා සහ මිල ගණන් 2020.03.11 දින, ප.ව. 2.00 ට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී.බී ජයා මාවත, කොළඹ 10 ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ මහවැලි අධිකාරියේ 09 වන මහලේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට නියමිත වෙලාවට පෙර බහාලීමට කටයුතු කල යුතුය. ඔබගේ ව්‍යාපෘති වාර්තා සහ මිල ගණන් භාරගැනීම අවසන් වූ වහාම ඒවා ප්‍රසිද්ධියේ විවෘත කරනු ලැබේ. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ "මහවැලි වැව් හා ජලාශ තුල සංචාරක බෝට්ටු / ඔරු සේවා" ලෙස හා ඉල්ලුම් කරන ජලාශය / වැව කුමක්ද යන්නත් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී එක් එක් වැව හෝ ජලාශය සඳහා වෙන වෙනම අයදුම් කල යුතු අතර පරිසර හිතකාමී ක්‍රමවේදයන්ට අනුකූලව යෝජිත සේවාවන් පවත්වාගෙන යාම සඳහා අදාල ආයතන / ආයෝජකයා යෝජනා කරනු ලබන තාක්ෂණික ක්‍රමවේද පිළිබඳව සවිස්තරාත්මක දත්ත ඇතුලත් ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

සංචාරක බෝට්ටු / ඔරු සේවා සඳහා ඉල්ලුම් කළ හැකි වැව් හා ජලාශයන්

| <u>බී කලාපය</u> | <u>වලව කලාපය</u> | <u>ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය</u> |
|---|---|---|
| දළුකාන වැව | චන්ද්‍රිකා වැව | වික්ටෝරියා ජලාශය |
| නෙළුම්වැව | කටුපිල වැව | පොල්ගොල්ල ජලාශය |
| රුහුණුකෙත වැව | | මොරගහකන්ද ජලාශය |
| පිඹුරත්තැව වැව | | |
| කළුකැලේ වැව | | |

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**
**අංක 500, ටී.බී ජයා මාවත,**
**කොළඹ 10**

වැඩි විස්තර
**011 2689652 දුරකථන අංකය මගින්**
අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන) අමතන්න.